ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

නාට්‍ය හා රංග කලාව - සිංහල I
Drama and Theatre - Sinhala I

**57 S I**

උපදෙස්:

II කොටස

* A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## A කොටස

1. (i) නාට්‍ය හා නෘත්‍ය අතර වෙනස පෙන්වා දෙන්න.
   (ii) නාට්‍ය කලාවේ සුවිශේෂ ලක්ෂණ **දෙකක්** පිළිබඳ කෙටි විවරණයක් කරන්න.
   (iii) නාට්‍ය යන්නට පෙරදිග විද්වතුන් දී ඇති අර්ථකථන විමර්ශනය කරන්න.

2. (i) ආංගික හෝ සාත්ත්වික අභිනය දෙකෙන් එකක් කෙටියෙන් හඳුන්වන්න.
   (ii) නාට්‍යධර්මී සම්ප්‍රදායේ වාචික අභිනය භාවිත වන අකාර පිළිබඳ නිදසුන් සහිත විවරණයක් කරන්න.
   (iii) ඔබ නැරඹූ නාට්‍යයක ආහාර්ය අභිනය භාවිතය ගැන විමර්ශනාත්මක සාකච්ඡාවක් කරන්න.

3. (i) කොහොඹා කංකාරියක් පැවැත්වීමේ මූලික අරමුණු කෙටියෙන් පැහැදිලි කරන්න.
   (ii) කොහොඹා කංකාරියක රඟ දැක්වෙන නාට්‍යමය අවස්ථා **තුනක්** නම් කොට, එකී අවස්ථා නාට්‍යමය වන්නේ කවර කරුණු නිසා දැ යි පැහැදිලි කරන්න.
   (iii) කොහොඹා කංකාරිය පහතරට ශාන්තිකර්මවලින් වෙනස් වන්නේ කවර කරුණු නිසා දැ යි විමර්ශනය කරන්න.

## B කොටස

4. (i) නාටිකා දශරූපක ගොන්නෙන් බැහැර කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද?
   (ii) ශ්‍රී හර්ෂගේ රත්නාවලියෙහි නාටිකා ලක්ෂණ අන්තර්ගත වන ආකාරය පෙන්වා දෙන්න.
   (iii) දශරූපකයේ ප්‍රභේද දෙකක් වන නාටක සහ ප්‍රකරණ සංසන්දනය කරමින් විමසන්න.

5. (i) සංස්කෘත නාට්‍යයක විකාසනයේ ප්‍රකට අවස්ථා **පහ** සඳහන් කරන්න.
   (ii) අභිඥානශාකුන්තලයෙන් හෝ රත්නාවලියෙන් නිදසුන් දෙමින්, ඉහත අවස්ථා අතරින් **තුන්වැනි** අවස්ථාව පැහැදිලි කරන්න.
   (iii) අභිඥානශාකුන්තලයේ සයවැනි අංකයේ එන ප්‍රවේශකය අදාළ වන්නේ එකී අවස්ථා පහෙන් කුමන අවස්ථාවේ ආරම්භය දැ යි පැහැදිලි කරන්න.

6. (i) කුවේණි නාට්‍යයේ මෙන් ස්ත්‍රිය ගැටුම්කාරී අවස්ථාවන්ට මුහුණ දෙන නවීන ලාංකේය නාට්‍ය **දෙකක** නම් ලියන්න.
   (ii) කුවේණි නාට්‍ය රචකයා විජයගේ චරිතය ප්‍රතිනිර්මාණය කොට ඇත්තේ කවරාකාරයෙන් දැ යි විමර්ශනය කරන්න.
   (iii) මූලාශ්‍රයයෙහි එන කුවේණි චරිතය නාට්‍යකරුවා යළි අර්ථකථනය කරන්නේ කෙසේ දැ යි පැහැදිලි කරන්න.

WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library